**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 558 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 31/03/2024 පැය 1120

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ගලඋඩ පොලිස් වසම.

2024.03.30 වන දින උදෑසන කාලයේ ගලඋඩ පොලිස් වසමේ ගෝඩුන්න ප්‍රදේශයේදී පුද්ගලයකු පහරදීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා ගලඋඩ ප්‍රාදේශීය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට ගලඋඩ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වන ගෝඩුන්න, හාලිඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවසේ සිටින අවස්ථාවේ ඔහුගේ පුතා සමඟ ඇති වූ බහින් බස් වීමක් දුර දිග යාමෙන් පසු පුතා විසින් මරණකරු තල්ලු කර ඇති අතර එහිදී මරණකරු බිම ඇද වැටීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා ගලඋඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශණයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය ගලඋඩ ප්‍රාදේශීය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනයට සම්බන්ධ වයස අවුරුදු 26 ක් වන මරණකරුගේ පුතා වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. ගලඋඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - මැදිරිගිරිය පොලිස් වසම.

2024.03.30 වන දින උදෑසන කාලයේදී මැදිරිගිරිය පොලිස් වසමේ මැදිරිගිරිය හිඟුරක්ගොඩ මාර්ගයේ උල්පත්ඇලගමට හැරෙන හංදිය ආසන්න ප්‍රදේශයේදී මැදිරිගිරිය දෙස සිට හිඟුරක්ගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඉදිරියෙන් ගමන් කල පාපැදියකට ඉස්සර කිරීමට යාමේදී එම පාපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු මැදිරිගිරිය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා පොළොන්නරුව රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 83 ක් වන හිඟුරක්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. මැදිරිගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**